# 6 මධ්‍යකාලීන ආසියාව

**මෙම ඒකකයෙන් ඉස්ලාම් ධර්මය ව්‍යාප්ත වූ ආකාරයත් ඉන්දියාවට එල්ල වූ මුස්ලිම් ආක්‍රමණ හා දිල්ලි සුල්තාන්ගේ පැවති මුස්ලිම් රාජවංශ පිළිබඳවත් චීනය, බුරුමය. කාම්බෝජය වැනි රටවල් හා ලංකාව අතර පැවති ආගමික සංස්කෘතික සබඳතා පිළිබඳවත් අධ්‍යයනය කිරීමට හැකි ය.**

## ඉස්ලාම් ධර්මයේ ආරම්භය හා ව්‍යාප්තිය

ඉස්ලාම් ධර්මයේ ආදී කර්තෘ ලෙස සලකන්නේ මහම්මත්තුමා ය. එතුමා උපන්නේ ක්‍රි.ව. 570 දී ය. වෙළහෙළඳමේ යෙදුන එතුමා මක්කම පදිංචි ව සිටියේ ය. කඩීජා නම් ධනවත් වැන්දඹුව එතුමාගේ භාර්යාව වූවා ය. දෙවියන්ගේ එක ම නියෝජිතයා තමන් බව එතුමා දේශනා කළේය. එතුමා දේව වාක්‍ය දේශනා කළ අතර එම ඉගැන්වීම් ඇතුළත් ග්‍රන්ථය ශුද්ධ වූ කුරාණය නම් වේ. පිළිම හා චිත්‍ර වන්දනය ප්‍රතික්ෂේප කළ මෙතුමා කුල භේදය වැනි සංකල්ප මුළුමනින් ම ප්‍රතික්ෂේප කර ඇත සියලු ම මුස්ලිම්වරුන් එක ම සහෝදර පිරිසක් ලෙස සැලකුවේ ය. ඉස්ලාම් ධර්මය සර්ව බලධාරි අල්ලාහ් දෙවියන් ගැන විශ්වාසය තබයි.

ඉස්ලාම් ආගමේ “ෂියා” හා “සුන්නි” ලෙස නිකායන් දෙකක් පවතී. කුරාණය පමණක් පිළිගත් පිරිස ෂියා නිකායට අයත් වූ අතර හදීත් නම් ග්‍රන්ථය ද පිළිගත් පිරිස සුන්නි නිකායට අයත් වූහ.

මහම්මත්තුමාගෙන් පසු ව ඉස්ලාම් ධර්මයේ ආරක්ෂකයා හෙවත් කලීෆා වූයේ අබුබකර් තුමා ය. ඔහුට පසු ව ආරක්ෂකයා වූයේ උමාර් නම් කලීෆා ය. මුස්ලිම් ආගමික හා රාජ්‍ය නායකයා ලෙස කලීෆා සලකන ලදී. ඉස්ලාම් ධර්මය කලීෆාවරුන්ගේ අනුදැනුම මත ව්‍යාප්ත විය. යුරෝපීය බලය ක්‍රි.ව. 16 - 19 සියවස්වල ලොව පුරා ව්‍යාප්ත වූවා මෙන් ඉස්ලාම් බලය ද ව්‍යාප්ත වීම ලොව විවිධ ප්‍රදේශවලට එකවර ම වාගේ සිදු විය.



**රූපය 6.1 - මක්කම**

මහම්මත්තුමා මියගොස් වර්ෂ 10ක් යන විට සිරියාව, ඉරාකය හා මිසරය මුස්ලිම් බලයට යටත් විය. ඊට පසු පර්සියාව, ඇනටෝලියාව, සුළු ආසියා ප්‍රදේශ යටත් විය. අටවෙනි ශත වර්ෂයේ දී උතුරු අප්‍රිකානු ප්‍රදේශවලට ද යුරෝපයේ තුර්කිය, ස්පාඤ්ඤ හා දකුණු ප්‍රංශය දක්වා ද ඉස්ලාම් බලය ව්‍යාප්ත විය. මධ්‍ය ආසියාව, ඇෆ්ගනිස්ථානය හා ඉන්දියාව ද මුස්ලිම් බලයට යටත් වූ අතර ඊටත් පසු ව ඉන්දුනීසියාව, මලයාසියාව, මාලදිවයින ආදී රටවලට ද මුස්ලිම් බලය ව්‍යාප්ත විය.


## ඉන්දියාවට මුස්ලිම් බලය ව්‍යාප්ත වීම

මුලින් ම ඉන්දියාවට මුස්ලිම් ආක්‍රමණයක් එල්ල වූයේ ක්‍රි.ව. 8 සියවසේ මුල්තාන් - සින්ධ් ප්‍රදේශයට යි.

එයට පෙර අනාදිමත් කලක පටන් අරාබිවරු වෙළඳම පිණිස ඉන්දියාවට පැමිණිය හ. ක්‍රි.ව. 636 දී භාරුකච්ච ප්‍රදේශයේ රැඳී සිටි මුස්ලිම්වරුන් පලවා හරින ලද බව වාර්තා වේ. ක්‍රි.ව. 636 සිට 664 දක්වා මුස්ලිම්වරුන්ගෙන් කොල්ලකාරී ආක්‍රමණ කිහිපයක් ඉන්දියාවට එල්ල වී ඇත. එහි දී සුළු වශයෙන් ප්‍රදේශ ද අල්ලා ගන්නා ලදි.

ක්‍රි.ව. 700 වන විට ඉන්දියාවට එල්ල වූ මුස්ලිම් ආක්‍රමණ දේශපාලනමය ස්වරූපයක් ගත්තේ ය. ක්‍රි.ව. 711 - 712 අතර ඉන්දියාව ආක්‍රමණය කරන ලද්දේ ඉරාක ප්‍රදේශයේ මුස්ලිම් පාලක අල්හජ්ජාජ් විසින් ය. ඔහු යටතේ ඉන්දියාවට පැමිණියේ **මොහොමඩ් බින් කාසීම් ය.** කාසිම් මෙම ආක්‍රමණයෙන් මහා ධනස්කන්ධයක් රැගෙන ගියේ ය.

කාසීම්ගේ ආක්‍රමණයෙන් පසු සින්ධ් හා මුල්තාන් නගරවල හමුද රඳවා තව දුරටත් ඒවා මුස්ලිම්වරුන් අතෙහි ම තබාගන්නා ලදී. මුස්ලිම් ආගමික ප්‍රතිපත්තිය මත සත්‍ය වූ එක ම ආගම ඉස්ලාම් ය. යුදෙව් හා ක්‍රිස්තියානි දේව භාෂිත ආගම් ලෙස සලකන ලද නිසා ඒවා අදහන්නන්ගෙන් "ජෙසියා" නම් බද්දක් අයකරන ලදී. හින්දු, බෞද්ධ ආගම් පිළිම අදහන්නන් වූ නිසා ඒවා විනාශ කරන ප්‍රතිපත්තියක් පැවතුණි. මේ නිසා කාසිම්ගේ සේනාවන්ගෙන් වෙහෙර විහාර, දාගැබ්, කෝවිල් විනාශ විය. වස්තුව කොල්ලකෑම්වලට භාජනය විය.




රූපය 6.1 - ඝෝර්හි මොහොමඩ් ගේ ආක්‍රමණය

## තුර්කි ආක්‍රමණ

ක්‍රි.ව. එකොළස්වන සියවස වන විට ඉන්දියාවේ අභ්‍යන්තර දේශපාලන බලය දුර්වල වී තිබුණි. මේ වන විට මක්‍රාන් සහ ඛයිබර් දුර්ග මාර්ග මුස්ලිම්වරුන් අත පැවතුණි.

## ඝස්නියේ මොහොමඩ් (998 - 1028)

ඇෆ්ගනිස්ථානයේ ඝස්නි ප්‍රදේශයේ පාලකයා ලෙස මොහොමඩ් ක්‍රි.ව. 998 දී පත් විය. ඔහු ක්‍රි.ව. 999 - 1027 දක්වා දහත් වරක් ඉන්දියාව ආක්‍රමණය කර ඇත. ඔහු ෂාහි බලකොටුවේ සිට ආක්‍රමණ මෙහෙයවා ඇත. ඔහුගේ ආක්‍රමණවල අරමුණ වූයේ තම රාජ්‍ය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ධනය ඉන්දියාවෙන් ලබාගැනීමයි. සෝම්නාත් දේවාලය විනාශ කර කොල්ලකෑමෙන් ඔහුගේ ආක්‍රමණ අවසන් විය.

## ඝෝර්හි මොහොමඩ් ක්‍රි.ව. (1173 - 1206)

ඔහු ප්‍රථම වරට ඉන්දියාව ආක්‍රමණයට කළේ ක්‍රි.ව. 1175 දී ය. **බෝලාන්** දුර්ගය හරහා පැමිණි ඔහු මුල්තාන් විනාශ කළේ ය. ඔහුගේ එම ආක්‍රමණය මුස්ලිම් ආධිපත්‍යය ඉන්දියාවේ තහවුරු වීමට බලපෑවේ ය. **බක්තියාර් බල්ජි** සහ **අයිබෙක්** ඔහුගේ ආක්‍රමණවල දී ඉතා වැදගත් වූ දෙදෙනෙකි.

## දිල්ලි සුල්තාන් රාජ්‍ය

13 වන සියවසෙන් පසු දිල්ලිය මුල්කරගෙන මුස්ලිම් රාජ්‍යයක් බිහි විය. එය දිල්ලි සුල්තාන් අධිරාජ්‍යය නම් විය. දිල්ලි සුල්තාන් අධිරාජ්‍යයේ රාජවංශ කිහිපයක් රජකම් කර ඇත.

**දිල්ලි සුල්තාන්**

| වහල් රාජවංශය | බල්ජි රාජවංශය | ටුග්ලුග් රාජවංශය | සෙයියදු රාජවංශය | ලෝදි රාජවංශය |
|---|---|---|---|---|
| ක්‍රි.ව. 1206-1290 | ක්‍රි.ව 1290-1320 | ක්‍රි.ව. 1320 - 1413 | ක්‍රි.ව. 1414 - 1451 | ක්‍රි.ව. 1451 - 1526 |

## වහල් රාජවංශය


ඝෝර්හි මොහොමඩ්ගේ වහලෙකු ව සිට නිදහස් වූ අයිබෙක් විසින් දිල්ලි සුල්තාන් රාජවංශය ආරම්භ කරන ලදී. ඔහු ට පසුව රජවරුන් දෙදෙනෙකු හා රජනක ද තවත් දුර්වල පාලකයන් කිහිප දෙනෙකු ද රජකම් කර ඇත.

## බල්ජි රාජවංශය

බල්ජි රාජවංශයේ ශ්‍රේෂ්ඨතමයා ලෙස අලා - උද් - දීන් බල්ජි හැඳින්විය හැකි ය. ඉන්දියාවට පොදු ආගමක් හඳුන්වාදීමට ඔහු මහත් උත්සාහයක් ගෙන ඇත. මලික් කපූර් ඔහුට සිටි දක්ෂ සෙන්පතියෙකි.

## ටුග්ලුග් රාජවංශය

වසර 93ක් දිල්ලියේ රජකළ මේ ටුග්ලුග් රාජවංශය දවස බල්ජි පරපුර ගොඩනැංවූ විශාල අධිරාජ්‍ය දෙදරා යාම ආරම්භ විය. මෙකල හින්දු හා මුස්ලිම් පාලන ඒකක බිහිවිය. ඉන්දියාවේ ආර්ථික සංවර්ධනය ඇති කිරීමට උත්සාහ ගැනීම මේ රාජවංශයේ විශේෂ ලක්ෂණයකි. තව ද මෙකල විජයනගර් වැනි හින්දු රාජ්‍ය දකුණු ඉන්දියාවේ ආරම්භ විය. ටුග්ලුග් රාජ වංශයේ වැදගත් පාලකයෙකු වූයේ මොහාමඩ් බින් ටුග්ලුග් ය.




රූපය 6.2 - මොහොමඩ් බින්ටුග්ලුක්ගේ ඉන්දියාව

## සෙයියදු රාජවංශය

අරාබියෙන් පැමිණි තවත් රාජවංශයකි. 37 වසක් දිල්ලි සුල්තානයේ පාලනය මෙහෙය වූ මේ රාජවංශය දේශපාලන වශයෙන් ශක්තිමත් නො වී ය.

## ලෝදි රාජවංශය

වසර 75ක් පමණ බලයේ සිටි මේ රාජ වංශයට පසු ව මෝගල්වරු දිල්ලි සුල්තානයේ බලය අල්ලාගත්හ.

## රාජවංශවල වැදගත් පාලකයෝ

| වහල් රාජවංශ | බල්ජි රාජවංශය | ටුග්ලුග් රාජවංශය |
|---|---|---|
| අයිබෙක් | ජල උද්දීන් පිරෝජ් බල්ජි | ගියාස් උද්දින් ටුග්ලුග් |
| ඉල්තුත්මිෂ් | | |
| පිරෝෂ් ෂා | අලා උද්දීන් බල්ජි | මොහොමඩ් බින් ටුග්ලුග් |
| රශියා (රැජන) | මුබාරක් ෂා බල්ජි | පිරූෂ් ටුග්ලුග් |
| | | II ගියාස් උද්දින් ටුග්ලුග් |


| සෙයියදු රාජවංශ | ලෝදි රාජවංශය |
|---|---|
| කිසර් බාන් | බහලොල් ලෝදි |
| මුබාරක්ෂා | ෂිකන්දර් ලෝදි |
| මහමුද්ෂා | ඊබ්‍රහීම් ලෝදි |
| අලාම් ෂා | |

## මෝගල් රාජවංශය

දිල්ලි සුල්තානය පාලනය කළ ලෝදි රාජවංශය තුළ තිබූ අසමගිය මෝගල් අධිරාජ්‍යය ඉන්දියාවේ ස්ථාපිතවීමට එක් හේතුවක් විය. අලාම් ලෝදි බාබුර්හට ඉන්දියාවට පැමිණෙන ලෙස ආරාධනා කළේ ය.

බාබුර්ගේ විශේෂත්වය වන්නේ සිය පියාගෙන් ලද කුඩා පර්ගානාව රැකගැනීමට නොහැකි වුව ද ධන බලය, පිරිස් බලය, සහ අවි බලයෙන් යුතු විශාල භූමියක් හිමි දිල්ලි සුල්තාන් අධිරාජ්‍ය පරාජය කිරීමට හැකි වීමයි. එයට හේතුව ඊබ්‍රාහිම් ලෝදිගේ තිබූ දුර්වලතාවලින් ප්‍රායෝජන ගැනීමට ඔහු සමත් වීමයි.

ක්‍රි.ව. 1526 පනිපත් සටන මෝගල් බලය ඉන්දියාවේ ස්ථාපිත වීමට හේතු වි ය.




රූපය 6.2 - බාබුර්ගේ රාජසභාව

**මෝගල් යුගයේ වැදගත් පාලකයන්**

1. බාබූර්
2. හුමායුන්
3. අක්බාර්
4. ජහන්ගීර්
5. සාජහන්
6. ඖරංෂේබ්

## මහා අක්බාර් රජතුමා

මෝගල් රාජවංශයේ ශ්‍රේෂ්ඨතම පාලකයා මහා අක්බාර් රජතුමා ලෙස පිළිගැනේ. එතුමා අධිරාජ්‍ය තුළ මනා පරිපාලනයක් ගෙන ගියේ ය. තව ද එතුමාගේ සුවිශේෂත්වය වන්නේ මුස්ලිම් පාලකයකු වුවත් සෙසු ආගම් කෙරෙහි දැක්වූ සහනශීලීත්වයයි. එතුමා රාජ්පුත්වරුන් කෙරෙහි අනුගමනය කළ ප්‍රතිපත්තියෙන් එය පැහැදිලි ය.

01. රාජ්පුත් කාන්තාවන් අන්තඃපුරයට ගෙන්වා ගැනීම නතර කළේ ය.
02. අන්‍ය ආගමිකයන්ගෙන් අය කළ ජෙසියා බද්ද අහෝසි කළේ ය.
03. ආගම ඇදහීමේ නිදහස ප්‍රදානය කළේ ය.

දැඩි රණකාමී පාලකයකු වුවත් එතුමා රාජ්පුත්වරුන් කෙරෙහි අනුගමනය කළ ප්‍රතිපත්තියෙන් එතුමාගේ රාජ්‍ය උපාය ඥානය පැහැදිලි වේ.



රූපය 6.3 - මහා අක්බාර් රජතුමා

**මා මාංශ අනුභව නොකරන්නේ සෙසු සතුන්ගේ ශරීර වළලන වළක් බවට මාගේ ආමාශය පත්කර ගැනීමට ඇති ඇකැමැත්ත නිසාය.**

**- මහා අක්බාර් රජතුමා -**

මහා අක්බාර් රජු බදු එකතුකිරීම සහ පරිපාලනය ද ක්‍රමවත් කළේ ය. එහි දී **මන්සද්දර් ක්‍රමය** හඳුන්වා දුන්නේ ය. ඒ මගින් සෑම රාජ්‍ය නිලධාරියෙකු ම තරාතිරම අනුව හමුදා නිලධාරියෙකු ද විය. උදා: රජගෙදර කෝකියා භටයින් දහ දෙනෙකු භාර හමුදා නිලධාරියෙකි. රජුගේ ලේකම්වරයා වූයේ දහසක හමුදා භටයන් භාර හමුදා නිලධාරියෙකි.

මෙයින් පසු බලයට පත් වූ **ජහන්ගීර්** අධිරාජ්‍ය පවත්වාගෙන ගියේ ය. මේ රජුගේ පාලන කාලයේ දී ඉංග්‍රීසින් ඉන්දියාවට පැමිණ සුරාත්හි බලකොටුවක් ඉදිකර ඇත.

ඉන් අනතුරු ව බලයට පත් වූ **සාජහාන්** රජු ද සාමාන්‍ය පාලකයකු ලෙස කල් ගෙවී ය. එතුමා විසින් සිය දේවිය සිහිවීම පිණිස ආග්‍රාහි ටජ්මහල් මන්දිරය තනවන ලදී.

ඖරංෂේබ් දවස මෝගල් අධිරාජ්‍යයේ පරිහානිය පෙන්නුම් කරන ලක්ෂණ පහළ විය. ඔහු අක්බාර් රජතුමා ඇති කළ ප්‍රතිසංස්කරණ නොසලකා හැරියේ ය. හේ හින්දු රාජ්‍යයන් වූ මරාඨ සහ රාජ්පුත්වරුන් සමග නොනිමි අරගලයකට මුල පිරී ය. පරිපාලනය ද දුර්වල විය.

**ක්‍රියාකාරකම**
**මහා අක්බාර් රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයකු වන්නේ ඇයිදැයි සාකච්ඡා කරන්න.**



රූපය 6.4 - කුතුබ්මිනාර්

## ඉන්දියාවේ ප්‍රාදේශිය මුස්ලිම් රාජ්‍ය

කාශ්මීර, සින්ධ් (මන්සූරා), මුල්තානය, ගුජරාටය, ජෞන්පූර්, බෙංගාලය, මාල්වා, ඛාන් දේශය, බහමනිය. බෙරාර්, අහමද්නගර්, බිජාපූර්, ගොල්කොන්ඩා, බිදර් වැනි මුස්ලිම් ප්‍රාදේශීය රාජ්‍යයන් පැවතුනි.


මුස්ලිම් ගෘහ නිර්මාණ ශිල්පය ඉන්දියාව තුළ දැකිය හැකි ය. ටජ්මහල්, කුතුබ්මිනාර් ඇතුළු ඉදිකිරීම් රැසක් ඒ අතර වේ.

## බහමනි රාජ්‍ය (ක්‍රි.ව. 1347 ක්‍රි.ව. 1526)

මොහොමඩ් බින්ටුන්ග්ලුග්ගේ විවිධ තාඩන පීඩන නොඉවසූ දකුණේ සිටි මුස්ලිම් ප්‍රභූවරු ක්‍රි.ව. 1347 දී කැරැල්ලක් ඇතිකර දෞලතාබාද් සියතට ගෙන **ඉස්මයිල් මුඛ** නම් පාලකයා බලයට පත් කළහ. ඔහු වඩාත් දක්ෂ හා තරුණ අබුල් මුසාපර් අලා - උද් - දීන් බහමන් ෂා වෙත රාජ්‍ය පැවරී ය. බහමනි රාජ්‍යයේ අගනුවර ගුල්බර්ගය නම් විය. අහමද් ෂා අගනුවර බවට **බිදරය** පත්කර ගෙන ඇත. පිරූද් ෂා බහමනිගේ සිටි දක්ෂතම හා බලවත් ම පාලකයා ය.

බහමන් ෂා බහමනි රාජ්‍යයට දකුණින් පිහිටි **වරංගල්, විජයනගර්** වැනි හින්දු රාජ්‍ය සමග මුළු ජීවිත කාලය පුරා ගැටුණි. දකුණු ඉන්දියාවේ මුස්ලිම් බලය රැඳී තිබුණේ මේ රාජ්‍ය හේතුවෙනි.

## විජයනගර් අධිරාජ්‍යය (ක්‍රි.ව. 1336 - 1576)



රූපය 6.5 - ටජ් මහල්

මෙය දකුණු ඉන්දියාවේ තුංග භද්‍රා නදිය අසල ඇති වූ නිදහස් හින්දු රාජ්‍යයකි. හරිහර හා බුක්ක විසින් මෙම රාජ්‍ය ආරම්භ කරන ලදී. සියවස් තුනක කාලයක් දකුණු ඉන්දියාවේ හින්දු සංස්කෘතිය මුස්ලිම් බලයට යටත් නොවී පවත්වා ගෙන යාම මෙකී අධිරාජ්‍යයෙන් සිදු වූ වැදගත් ම සේවයයි. මෙම අධිරාජ්‍යයේ සිටි ක්‍රිෂ්ණ දේවරාය රජු (ක්‍රි.ව. 1501-1530) එහි සිටි බලවත් ම පාලකයා ය.

මේ රාජ්‍ය අවධියේ තෙලිඟු සාහිත්‍ය විශිෂ්ටත්වයට පත් විය. විජය නගර් ගෘහ නිර්මාණ ශිල්පය ද කූටප්‍රාප්තියට පත් විය. දකුණු ඉන්දියාවේ වරදරාජ දේවාලය, ගල්රථ දේවාලය එයට උදහරණ ය.

මේ අධිරාජ්‍යය බහමනි නම් මුස්ලිම් අධිරාජ්‍යය සමඟ නිරන්තර අරගලයක යෙදී සිටියේ ය. ලංකාවේ යාපනයේ ප්‍රාදේශීය රාජ්‍යයේ ආර්ය චක්‍රවර්තී පාලකයන් ද මෙම අධිරාජ්‍ය සමග සබඳතා පවත්වා ඇත.

## බුදු දහම හා හින්දු ධර්මය ආසියාව කෙරෙහි ඇති කළ බලපෑම

### මධ්‍ය ආසියා ප්‍රදේශය



රූපය 6.6 - බුදුපිළිමයක්



රූපය 6.7 හින්දු කෝවිලක්



රූපය 6.8 - ශිව රූපය

බුදුදහම හා හින්දු ආගම යන ආගම් දෙක ම බිහිවූයේ ඉන්දියාවේ ය. දනට ලැබී ඇති පුරාවිද්‍යාත්මක සාධක අනුව මධ්‍ය ආසියානු ප්‍රදේශයේ බෞද්ධාගම පැවති ඇත. මුස්ලිම් ආක්‍රමණ එල්ලවීමට ප්‍රථම සමර්කාන්ඩ්, බොසොස්කෝයි ආදී ප්‍රදේශවල බුදුදහම පැවතුණි.

මධ්‍ය ආසියාවේ ඇති බාමියන් බුදු පිළිම ධර්මාශෝක රජ දවසට අයත් බවටත් ඒවා ඉදිවූයේ කණිෂ්ක රජුගේ දවස සිව්වෙනි ධර්ම සංඝායනාවෙන් පසු ව බවටත් මතයක් ඇත.

ශිව ආගම මෙන් ම විෂ්ණු ඇදහීම ද මධ්‍ය ආසියානු ප්‍රදේශවල පැවති බවට සාධක ලැබී ඇත. ඉන්දියාවට පැමිණි වෙළෙඳුන් මගින් මධ්‍ය ආසියා ප්‍රදේශවල බුදුදහම හා හින්දු ආගම ව්‍යාප්ත වන්නට ඇත.

## චීනය



රූපය 6.9 - කොන්ෆියුසියස් තුමා

චීනයේ ප්‍රධාන ආගම් 03ක් පවතී. එනම් කොන්ෆියුසියස් ධර්මය, ටාඕ ධර්මය හා බුද්ධ ධර්මයය.

චීනයට බුදුදහම ව්‍යාප්ත වීම සම්බන්ධව විවිධ මත පවතී. කාශ්‍යප **මාතංග හිමියන්** හෝ වූ **පාලන් නම්** මධ්‍ය ආසියාවේ භික්ෂූන්වහන්සේ නමක් චීනයට බුදුදහම හඳුන්වා දුන් බවට ද මත පළ වී ඇත. කාශ්‍යප මාතංග හිමියන් බුදු දහම ගෙන ගිය බව දනට වැඩි දෙනෙකු පිළිගන්නා මතය යි.

ක්‍රි.ව. 1 සියවසේ චීනයට බුදුදහම ගෙන යන විට චීනය පාලනය කළේ හං රාජවංශයයි. ඔවුන් ඒ වන විට කොන්ෆියුසියස් ධර්මයට බොහෝ සේ නැඹුරු ව සිටි නිසා බුදු දහමට එතරම් සැලකිල්ලක් නො දක්වී ය. ක්‍රි.ව. 4 සියවසේ බලයට පත් "වෙයි" රාජවංශිකයන් බෞද්ධයන් වූ නිසා බුදුදහමට මහත් සැලකිලි ලැබුණි.

ක්‍රි.ව. 429 දී හා 433 දී නන්දි නම් නැව් හිමියකු දේවරාසා මෙහෙණින් වහන්සේ ප්‍රමුඛ මෙහෙණින් වහන්සේලා කණ්ඩායම් 2ක් චීනයට වැඩමවා ගෙන ගොස් චීනයේ භික්ෂුණී ශාසනය ආරම්භ කර ඇත. පුණ්‍යසාර, ධර්මරුචි, බුද්ධ යසස් සහ සංඝභද්‍ර යන හිමිවරුන් චීනයට පැමිණ ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ චීන බසට පරිවර්තනය කර ඇත.

පාහියන්, හියුංත්සාං, ඉත්සිං වැනි චීන භික්ෂූන් වහන්සේලා ලංකාව, ඉන්දියාව වැනි සෙසු බෞද්ධ රටවල් සමග සබඳතා පවත්වා ඇත.

කෝට්ටේ යුගයේ දී ලංකාවට පැමිණි චෙං හෝ නම් චීන තානාපතියා වන්දනාමාන කටයුතුවලට ද සහභාගි වූ බව සඳහන් වේ. චීනයේ අද දක්වා බුදුදහම පවතී.

## බුරුමය

ධර්මාශෝක රජතුමා ස්වර්ණභූමි නම් ප්‍රදේශයට ධර්ම දූතයන් වහන්සේලා යැවූ අතර ඒ මෙම ප්‍රදේශය බුරුමය යැයි පිළිගැනේ. බුරුමය පිරිසිදු ථෙරවාදය අදහන රටකි. සෝණ උත්තර තෙරුන්වහන්සේලා බුරුමයට දහම් පණිවිඩය ගෙන ගොස් ඇත.

වර්තමාන "පෝම්" හා "හ්මව්සා" නගරවලින් ලැබී ඇති පුරාවස්තුවලින් බුරුමය ප්‍රබල බෞද්ධ රටක් බව තහවුරු වේ. දකුණු බුරුමයේ "සීහල සංඝ නිකාය" නම් නිකායන් ද පැවැති යේ ය.

මහාවිජයබාහු රජුට නැව් පුරා ආධාර එවූ රටක් වූයේ බුරුමයයි. එමෙන් ම එතුමාගේ දවස බුරුමයෙන් උපසම්පදාව රැගෙන පැමිණි බව මූලාශ්‍රයවල සඳහන් වේ.

බුරුමයේ කල්‍යාණි ශිලාලිපිය අනුව මෙරටට වැඩම කළ බුරුම හිමි නමක් එරට රජුගේ උපදෙස් පරිදි සංඝ සංශෝධනයක් සිදු කර ඇත.

ක්‍රි.ව. 1527 දී ආවා නුවර රජ පැමිණි ථොහන්බවා රජු භික්ෂූන් 3000 රැස්කර මරා දැමූ නිසා ඇමතියෙකු ඒ රජ මරා දමා ඇත. ක්‍රි.ව. 1605 දී මහා ධම්මරාජ රජතුමා විහාර විනාශ කළ පෘතුගීසීන්ව මරා දැම්මේය.



රූපය 6.10 - බුරුම සම්ප්‍රදාය අනුව ගොඩනැංවූ බුද්ධගයා විහාරය

බුරුමයට ගිය මෙරට භික්ෂූන් වහන්සේලා ක්‍රි.ව. 1807 දී අමරපුර කල්‍යාණවංශ නිකාය සහ ක්‍රි.ව. 1810 දී අමරපුර ශ්‍රී ධම්මරක්ඛිත නිකාය පිහිට වූහ.

## තායිලන්තය

බුරුම දේශයෙන් තායිලන්තයට බුදු දහම ව්‍යාප්ත වූ බවට මතයක් පවතී.

ජිනකාලමාලිය නම් ග්‍රන්ථයට අනුව මෙරටින් ගෙනගිය බුදු පිළිමයක් "සීහලපටිමා" යනුවෙන් එරට ඇත. ලංකාවෙන් වැඩම කළ සුමන හිමි සහ ආනන්ද හිමි සියමේ බෞද්ධ කටයුතුවලට උපකාර කර ඇත. මෙරටින් ශ්‍රී මහා බෝධි අංකුරයක් ද ගෙන ගොස් රෝපණය කර ඇත.

ජිනකාලමාලිය අනුව. ක්‍රි.ව. 1425 දී කැලණියේ පැවති මහා උපසම්පද විනය කර්මයට තායි භික්ෂූන් වැඩම කරවා ඇත.

කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස ක්‍රි.ව. 1753 දී තායිලන්තයෙන් පැමිණි උපාලි හිමි ප්‍රමුඛ හිමිවරු වැලිවිට සරණංකර හිමි ඇතුළු ලාංකීය භික්ෂු පිරිසක් උපසම්පදාවට පත් කළෝය.

තායිලන්තයේ වර්තමානයේ ද සංඝරාජ පදවියක් පවතී.

## ජාවා සුමාත්‍රා

ක්‍රි.ව. 7 සියවස වන විට ථෙරවාදී බුදුදහම ජනප්‍රිය ව පැවති බව ඉත්සිං හිමි වාර්තා කර ඇත.

සුමාත්‍රාවේ පෙලෙන්බාගේ නම් ස්ථානයේ සහ ජාවාවල බෝරෝබුදූර්, කේදු වැනි බෞද්ධ සිද්ධස්ථානවල බෞද්ධ නටබුන් පවතී.

## කාම්බෝජය

අංකෝර් රජ දවස මහායාන බුදුදහම හා බ්‍රාහ්මණ ධර්මය ව්‍යාප්ත ව ඇත.

ගල් පර්වත කැන දේවාල තනා ඇත.


එරට පිහිටි ක්‍රි.ව. 12 සියවසට අයත් අංකෝර්වට් වැදගත් බෞද්ධ සිද්ධස්ථානයකි.



රූපය 6.11 - අංකෝර්වට් විහාරය

## ශ්‍රී ලංකාව අග්නිදිග ආසියාව සමග සබඳතා

- මහා පරාක්‍රමබාහු මහා විජයබාහු වැනි රජවරුන් අග්නිදිග ආසියාව සමග සබඳතා පැවැත්වීය. දෙවනගල ශිලා ලිපියෙන් බුරුම ආක්‍රමණයට ගිය නගරගිරි කීර්ති සෙනවියාට ඉඩම් ප්‍රදානය කළ බව පැහැදිලි ය.
- මහාවිජයබාහු රජ දවස භාණ්ඩ පුරවාගත් නැව් බුරුමයෙන් එවන ලදී. උපසම්පදාව සඳහා භික්ෂූන් වහන්සේලා ද බුරුමයෙන් වැඩම කරවා ඇත.
- සුමාත්‍රාවේ පෙලෙන්බාගේහි දී හමු වූ අවලෝකිතේශ්වර ප්‍රතිමාව සිතුල්පව්වේ ප්‍රතිමාවට සමාන ය.
- බෝරෝබුදූර් නම් පන්සල ඉදිකිරීමේ දී මෙරටින් අභාසය ලබන්නට ඇත.
- ජාවා රටේ සෙල්ලිපියකට අනුව මෙරට අභයගිරි විහාරයේ ශාඛාවක් එරට පැවත ඇත.



රූපය 6.12 - බෝරෝ බුදුර් විහාරය

- ක්‍රි.ව. 13වන සියවසේ ලංකාව ආක්‍රමණය කළ චන්ද්‍රභානු රජු අග්නිදිග ආසියාවේ මලය අර්ධද්වීපයෙන් පැමිණියේ යැයි අනුමාන කිරීම.

### ක්‍රියාකාරකම්

1. අග්නිදිග ආසියාවේ බෞද්ධ රටවල් සිතියමක ලකුණු කරන්න.
2. ඒ රටවල ඇති බෞද්ධ ඓතිහාසික ස්ථාන ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

### සාරාංශය

- ඉස්ලාම් ධර්මය කලීෆාවරුන් යටතේ ව්‍යාප්ත වූ අතර ගස්නි මොහොමඩ් හා ඝූර් මොහොමඩ් ඉන්දියාව ආක්‍රමණය කළහ.
- දිල්ලි සුල්තාන් අධිරාජ්‍යයේ රාජවංශ ගණනාවක් යටතේ පාලනය විය.
- මෝගල් රාජවංශයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු වූයේ මහා අක්බාර් රජුය.
- දකුණු ඉන්දියාවේ මුස්ලිම් බලය පෙන්වන ප්‍රබල අවස්ථාවකි බහමනි රාජ්‍ය
- දකුණු ඉන්දියාව තුළ හින්දු සංස්කෘතිය ආරක්ෂාවීම විජයනගර් අධිරාජ්‍යයේ සිදුවිය.
- ඉන්දියාවේ ඇති වූ බුදුදහම හා හින්දුධර්මය මධ්‍ය ආසියාවේ ද ව්‍යාප්ත ව තිබූ බවට සාධක ඇත.
- අතීතයේ බොහෝ අග්නිදිග ආසියාතික රටවල් බෞද්ධ වූ බව පැහැදිලි වේ.
- ලංකාව බෞද්ධ රටක් වූ නිසා අග්නිදිග ආසියාතික රටවල් සමග අතීතයේ පටන් සබඳතා පවත්වා ඇත.

### අභ්‍යාස

1. ඉස්ලාම් ධර්මයේ ආරම්භය හා එම ධර්මය ගැන කෙටි විස්තරයක් කරන්න.
2. දිල්ලි සුල්තානයේ බලයට පත් වූ රාජවංශ නම් කරන්න.
3. බහමනි අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨ පාලකයා කවු ද?
4. විජයනගර් අධිරාජ්‍යයෙන් සිදු වූ වැදගත් සේවය කුමක් ද?
5. ටාජ්මහල් ඉදිකළේ කුමන රජතුමා ද?
6. චීනයේ ඇති ප්‍රධාන ආගම් 03 මොනවා ද?
7. තායිලන්තය හා බුරුමය අතීතයේ හැඳින්වූ නම් මොනවා ද?